# බස්නාහිර පළාතේ පළාත් සභා රැස්වීම

## 2017 මැයි මස 23 වන අඟහරුවාදා

**බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි**
**බස්නාහිර පළාත් සභා ගොඩනැගිලි සංකීර්ණයේ සභා ශාලාවේදී පවත්වන ලද රැස්වීම**

පූ.භා. 09.35 ට සභාව රැස් විය. ගරු සභාපතිතුමා මූලාසනාරූඪ විය.

- **පැමිණීම :**

| | |
|---|---|
| ගරු සුනිල් විජේරත්න | (සභාපතිතුමා) |
| ගරු යසපාල කෝරලගේ | (නියෝජ්‍ය සභාපතිතුමා) |
| ගරු ඉසුර දේවප්‍රිය | (බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමා) |
| ගරු ගාමිණී තිලකසිරි | (බස්නාහිර පළාතේ කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන අමාත්‍යතුමා) |
| ගරු රංජිත් සෝමවංශ | (බස්නාහිර පළාතේ අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමා) |
| ගරු ලලිත් වනිගරත්න | (බස්නාහිර පළාතේ මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන අමාත්‍යතුමා) |
| ගරු සුමිත් ලාල් මැන්දිස් | (බස්නාහිර පළාතේ සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා) |
| ගරු සුනිල් ජයමිණි | (සභා නායකතුමා) |
| ගරු ලාලන් සුදත් මංජු ශ්‍රී අරංගල | (විපක්ෂ නායකතුමා) |
| ගරු ගුණසිරි ජයනාත් | (ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා) |
| ගරු යූ. ජෝර්ජ් පෙරේරා | (විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා) |

**ගරු මන්ත්‍රීවරු**

අනන්ද හරිස්චන්ද්‍ර ද සිල්වා
අනුරාධ විමලරත්න
අනුරුද්ධ ලේකම්ගේ
අසෝක රන්වල
අශෝක දයාරත්න
අමල් සිල්වා
අර්ෂාඩ් නිසාම්ඩීන්
ඉෆ්තිකාර් ජෙමීල් මරික්කාර්
ඊ.ඒ. නන්දන පත්මකුමාර
උදාර රත්නායක
උදේන විජේරත්න
උපාලි කොඩිකාර
උපාලි ගුණරත්න
උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ
එම්.එස්.එම්. රහීම්
එස්. කුහවරදන්
එස්.එම්. සකාවුල්ලා
ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව
කාමල් කුරුප්පු
කිත්සිරි කහටපිටිය
කීර්ති කාරියවසම්
කුරුසාමි කලන්කාඩ් තේවර්
කේ.ඩී. අරුණ දීපාල්
කොලන්නගේ වජිර පෙරේරා
කෝකිලා හර්ෂනී ගුණවර්ධන මැතිනිය
ජගත් අංගගේ
ජගත් කුමාර
ජගත් පී. විතාන
ජනක දීපාල් වැලිවත්ත
ජයන්ත ද සිල්වා
ඩී.ඩබ්ලිව්. පුෂ්පකුමාර ද සිල්වා
ඩෝල්ටන් ජානක සූරියබණ්ඩාර
තුවාන් ආමිත් මොහමඩ් අක්රම්
තෙබුවන පියනන්ද හිමි
නිමල් ආර්. පීරිස්
නිමල් චන්ද්‍රරත්න
නිරෝෂ් ඩිල්ෂාන් ජයවර්ධන
නිරෝෂන් පාදුක්ක
නිරෝෂා අතුකෝරල මැතිනිය
නිශාන්ත ශ්‍රී වර්ණසිංහ
නීල් සුනේත්‍රලාල් ප්‍රනාන්දු
පී.ආර්.පී. අබේගුණවර්ධන
පී.ඩී. අබේරත්න
ප්‍රදීප් උඳුගොඩ
ප්‍රදීප් පෙරේරා
බී.පී. ලක්ෂ්මන් ගුණවර්ධන
මහේෂ් අල්මේදා
මංජුල ප්‍රසන්න සම්පත්
මංජුල බුද්ධදාස
මෙරිල් පෙරේරා
මොරිස් විජේරත්න
මොහොමඩ් ෆයිරුස්
මොහොමඩ් ෆායිස්
යූ.එල්.එන්.පී. උඩවෙල
රජිත හපුආරච්චිගේ
රවීන්ද්‍ර යසස් කුමානායක
රවී විජේසේකර
රොජර් සෙනෙවිරත්න
රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්
රෝස් ප්‍රනාන්දු මෙනෙවිය
ලක්ෂ්මන් නිපුණ ආරච්චි
ලලන්ත ගුණසේකර
ලලිත් එල්ලාවල
ලලිත් වර්ණකුමාර
ලෙනාඩ් කරුණාරත්න
විජිත් ප්‍රියන්ත
සරත් පතිරණ
සලෝචන ගමගේ
සිරිකමල් පිලීෂියන් ද සිල්වා
සුමිත් විජයමුණි ද සොයිසා
සුසිල් කිඳෙල්පිටිය
සෙනල් වෙල්ගම
සේනක දමයන්ත ද සිල්වා
ශිරන්ත අමරසේකර
හරිස්චන්ද්‍ර කොස්තා
හෙක්ටර් බෙත්මගේ

**නොපැමිණීම :**

**ගරු මන්ත්‍රීවරු**

ඇන්ටනී උපුල් රාජිත
ඇ. ශ්‍රීනාත් ම. පෙරේරා
ඉන්දික බණ්ඩාර
එස්.ඒ. සමන්මලී සකලසූරිය මැතිනිය
ගමගේ නිහාල් ප්‍රේමශාන්ත පෙරේරා
චන්දන ජයකොඩි
නව්සර් ෆව්සි
මල්ෂා කුමාරණතුංග මැතිනිය
මහින්ද ජයසිංහ
රන්දීර් රොද්‍රිගෝ
රොයිස් විජිත
ලයනල් ජයසිංහ
සන්ධ්‍යා සිරිවර්ධන මැතිනිය
සහන් ප්‍රදීප්
සුනිල් වටගල
සුසාර දිනාල්
ශ්‍රීනාත් පෙරේරා

## 01. ආණ්ඩුකාරවරයාගෙන් ලැබෙන සංදේශ

*ගරු ආණ්ඩුකාරතුමා විසින් මීට පෙර එවන ලද GOS/ADM/4/8/69 හා 2017.04.07 දිනැති ලිපියට අවධානය යොමු කරවමින් GOS/ADM/4/8/69 හා 2017.05.15 දිනැතිව යළිත් එවන ලද "2017 අංක 01 දරන බස්නාහිර පළාතේ තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන අධිකාරී ප්‍රඥප්තිය පිළිබඳව සඳහන් පණිවිඩයේ සංශෝධන[1] ගරු සභාපතිතුමා විසින් සභාවේ ප්‍රකාශයට පත් කරන ලදී.*

## 02. කාරක සභා වාර්තා :

ගරු සභාපතිතුමා විසින් 2017.04.26 හා 2017.05.05 යන දිනවල පැවති සභා කටයුතු පිළිබඳ කාරක සභා වාර්තා පිළිගන්වන ලදී.

අනතුරුව, 2017.04.18, 2017.04.25, 2017.04.26 දිනවල පැවති ප්‍රඥප්ති හා නීති පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව හා 2017.05.19 යන දින පැවති ප්‍රඥප්ති හා නීති කාරක සභා රැස්වීම් වාර්තාව [කාරක සභාවේ සභාපති වෙනුවෙන්] රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය විසින් ඉදිරිපත් කරන ලදී.

## 03. නොපැමිණ සිටීමේ අවසරය

*"රොයිස් විජිත ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමාට මාසයක කාලයක් රැස්වීම්වලට නොපැමිණ සිටීමට අවසර දිය යුතු යැයි යූ. ජෝර්ජ් පෙරේරා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභා සම්මත විය."*

***පූ.භා. 10.25 ට පමණ සභාවේ හට ගත් නොසන්සුන්තාවය මත ගරු සභාපතිතුමා විසින් සභාව තාවකාලිකව කල් තබන ලදුව, පූ.භා. 10.47 ට යළිත් රැස් විය.***

## 04. පළාත් සභාවේ කටයුතු - I :

සුමිත් ලාල් මැන්දිස් ගරු සභා කටයුතු අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් යෝජනාව සභා සම්මත විය.

*ගරු සභාපතිතුමනි, "අද දින පොදු කටයුතු ප්‍රමුඛතාවය ගත යුතුය."*

## 05. පළාත් සභාවේ කටයුතු - II :

*"2017.04.25 දින පළාත් සභා රැස්වීමේදී නිවේදනය කරන ලද 2017.02.07 දින සභා සම්මත "2017 අංක 01 දරන බස්නාහිර පළාතේ තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන අධිකාරී ප්‍රඥප්තිය" සම්බන්ධයෙන් ගරු ආණ්ඩුකාරතුමා විසින් එවනු ලැබූ, අංක GOS/ADM/4/8/69 දරන හා 2017.04.07 දිනැති පණිවිඩය මගින් නිර්දේශ කරනු ලබන සංශෝධනයන් ප්‍රඥප්ති හා නීති පිළිබඳ කාරක සභාවේ අදහස් කෙරෙහි ද සැලකිලිමත්ව, අද දින න්‍යාය පත්‍රයේ පොදු කටයුතු විෂයයේ අංක 01 හි සඳහන් එම වැඩ කටයුතු සඳහා කාර්යය පටිපාටි රීති අංක 57(1), 57(3) හා 57(4) හි සඳහන් විධිවිධානයන්ගෙන් කිනම් හෝ බාධාවක් සිදු නොවිය යුතු යැයි සළකා ක්‍රියා කිරීමට මෙම පළාත් සභාව එකඟ වෙයි."* යන යෝජනාව සුමිත් ලාල් මැන්දිස් ගරු සභා කටයුතු අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලදී.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***

***අනතුරුව, ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමා විසින් ඒ පිළිබඳව වැඩි දුරටත් සලකා බැලීමට අවශ්‍ය බව ගරු සභාපතිතුමාට කලින් ලිඛිතවත්, එවලේ වාචිකවත් කරන ලද කල් ඉල්ලීමේ යෝජනාවට සභාව විරෝධය පළ නොකළ හෙයින්, මාසයක කාලයක් ගරු සභාපතිතුමා විසින් කල් දෙන ලදුව, ඉහත යෝජනාව ඊට අදාළ න්‍යාය පත්‍රයට යොමු කරන ලෙස නියෝග කරන ලදී.***

[1] 2017.05.23 දින නිල වාර්තාව බලන්න.

## 06. **බස්නාහිර පළාතේ 2017 අංක .... දරන පළාත් පාලන ආයතන බලතල ක්‍රියාත්මක කිරීම පිළිබඳ ප්‍රඥප්තිය : පළමුවර කියැවීම**

*ගාමිණී තිලකසිරි ගරු අමාත්‍යතුමා විසින් [ගරු ප්‍රධාන අමාත්‍යතුමා වෙනුවෙන්] "බස්නාහිර පළාතේ 2017 අංක .... දරන පළාත් පාලන ආයතන බලතල ක්‍රියාත්මක කිරීම පිළිබඳ ප්‍රඥප්තිය" පළමුවන වර කියැවීම සඳහා සභාවට ඉදිරිපත් කරන ලදී.*

***අනතුරුව හේමන්ත සමරකෝන් මහතා [සභා ලේකම්] විසින්,***

***එහි පූර්විකාව වූ,***

*"බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතන බල ප්‍රදේශයක පළාත් පාලන ආයතනයන්හි කර්තව්‍ය සඳහා හේතු වන කවර හෝ සංවර්ධන කාර්යයක් සඳහා සූදානම් කෙරෙන ඉඩම් සහ ඉඩම් අනුබෙදුම් සඳහා සැලසුම්, සියලු ඉදිකිරීම් සැලසුම් පරීක්ෂා කිරීම් ද, ඊට අදාළව නියමයන් කිරීම ඇතුළු එම සැලසුම් අනුමත කිරීම ද ඒ සඳහා නිවාස හා නගර සංවර්ධන ආඥා පනතෙහි විධිවිධාන හා නගර හා ග්‍රාම නිර්මාණ ආඥා පනතෙහි විධිවිධාන බලපැවැත්වීම සඳහා ද, ඊට ආනුශංගික කරුණු සම්බන්ධයෙන් පළාත් පාලන ආයතන වෙත බලතල නිශ්චිත කිරීම සඳහා ද විධිවිධාන සැලසීම සඳහා වූ ප්‍රඥප්තියකි.*

*මෙම ප්‍රඥප්තිය 1982 අංක 4 දරන නාගරික සංවර්ධන අධිකාරී (සංශෝධන) පනතින් සංශෝධිත ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරී පනතේ 23 වන වගන්තියෙහි (1), (2), (3) හා (4) වන උප වගන්තීන්ට ද අනනුකූල වේ." යනුවෙන් ප්‍රකාශ කරන ලදී.*

***අනතුරුව, ප්‍රඥප්ති කෙටුම්පත ගරු සභාපතිතුමා විසින් ප්‍රඥප්ති හා නීති කාරක සභාවට යොමු කරන ලදී.***

## 07. **පෞද්ගලික මන්ත්‍රී යෝජනාව : [ගණ පූරණය නොමැතිව කල් ගියේය.]**

කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමා විසින් 2017.03.21 දින ඉදිරිපත් කළ යූ. ජෝර්ජ් පෙරේරා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා විසින් ස්ථිර කරන ලද, 2017.05.23 දින න්‍යාය පත්‍රයේ අංක X යටතේ වූ යෝජනාව යළිත් සභාභිමුඛ කරන ලදී.

***පූ.භා. 11.59 ට ජගත් කුමාර ගරු මන්ත්‍රීතුමා විසින් ගණපූරණය පිළිබඳ ප්‍රශ්නය නගන ලදුව, එවලේ සභාවේ ගණපූරණය නොමැති බව පෙනී ගියෙන්, කැඳවීම් සීනුව නාද කරවීමට නියෝග කරන ලදී. පසුවද, ගණපූරණය ඇති නොවූ බැවින්,***

***අ.භා. 12.01 ට පළාත් සභාව තාවකාලිකව අත්සිටුවන ලදින්, අ.භා. 12.17 ට ගරු නියෝජ්‍ය සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් යළිත් රැස්විය.***

## 08. **12(1) රීතිය යටතේ කල් තැබීම :**

**එතෙකුදු වුවත් ගණපූරණය නොමැති වූයෙන්**, එකී යෝජනාවේ ඉදිරි කටයුතු ඊළඟ සභාවට යොමු කරමින් ගරු නියෝජ්‍ය සභාපතිතුමා විසින් පළාත් සභාව කල් තබන ලදී.

***ඊට අනුකූලව, පළාත් සභාව අ.භා. 12.22 ට, 2017 ජූනි මස 06 වන දින පූ.භා. 09.30 වන තෙක් කල් ගියේය.***

හේමන්ත සමරකෝන්,
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2017.05.23
බස්නාහිර පළාතේ පළාත් සභාව,
5 වන මහල,බී පර්යන්තය,
සෙත්සිරිපාය, බත්තරමුල්ල.

අව/23
Minuts 2017.05.23- Hansard Section